# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 1635/6 – 2010 ජනවාරි 04 වැනි සඳුදා – 2010.01.04**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

### ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

### 38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ ආඥාව

### 2009 අංක 325 දරන ආඥාව

මගේ යොමු අංකය: එල්ඩී/05/2008/ඩී/465.
ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය: 2/3/1/4/6.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය) 38 වැනි වගන්තියේ (අ) අතුරු විධානයෙන් මා වෙත පවරා ඇති බලතල අනුව ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය ජීවන් කුමාරණතුංග වන මම පහත සඳහන් උපලේඛනයේ I වැනි ඡේදයේ සඳහන් ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියාට නැතහොත්, එකී නිලධාරියා විසින් ඒ සඳහා බලය දෙන ලද වෙනත් නිලධාරියාට, එම උපලේඛනයේ II වැනි ඡේදයේ දැක්වෙන නියමිත ඉඩම ස්වාමිත්වයට ගැනීමට මෙයින් නියම කරමි.

ජීවන් කුමාරණතුංග,
ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍ය.

2009 දෙසැම්බර් මස 15 වැනි දින.
"ගොවිජන මන්දිරය",
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

උපලේඛනය

1. **ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියා**.– ප්‍රාදේශීය ලේකම්, අඹන්ගඟ කෝරළේ.

2. **ඉඩමේ විස්තරය**.– මධ්‍යම පළාතේ, මාතලේ දිස්ත්‍රික්කයේ අඹන්ගඟ කෝරළේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අඹන්ගඟ කෝරළේ සුළු කොට්ඨාසයේ, කරගහතැන්න ගමේ පිහිටි සර්වේයර් ජනරාල්ගේ අංක මා/ඒඑම්බී/2009/189 හා 2009.09.22 දිනැති ප්‍රගමන අනුරේඛනයේ සඳහන් ප්‍රමාණයෙන් හෙක්. 0.1542 ක් වන පහත සඳහන් නමින් ප්‍රමාණයෙන් හා මායිම්වලින් යුක්ත ඉඩම් කොටස්:

01. කැබලි අක්ෂර 'ඒ' – කරගහතැන්න – ප්‍රමාණය: හෙක්. **0.1052**ක්
උතුරට: ස්වාධීන රූපවාහිනී ආයතනය සතු කරගහතැන්න වත්ත; නැගෙනහිරට: කැබලි අක්ෂර බී; දකුණට: ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාව සතු කරගහතැන්න වත්ත; බටහිරට: මාර්ගය.

02. කැබලි අක්ෂර 'බී' – කරගහතැන්න – ප්‍රමාණය: හෙක්. **0.0490**ක්
උතුරට: ස්වාධීන රූපවාහිනී ආයතනය සතු කරගහතැන්න වත්ත; නැගෙනහිරට සහ දකුණට: ඉඩම් කොමිෂන් සභාව සතු කරගහතැන්න වත්ත; බටහිරට: කැබලි අක්ෂර ඒ.

01 – 526

---

## ශුද්ධි පත්‍රිකාව

### ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

### 38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ ආඥාව

### 2008 අංක 121 දරන ආඥාව

මගේ යොමු අංකය: එල්ඩී/05/2009/ඊ/121.
ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය: කඹු/ඉ2/01/67.

අංක 1624/17 හා 2009.10.21 දින දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට්* පත්‍රයෙහි 1 ඒ පිටුවේ පල කරන ලද, 38 (අ) අතුරු විධානය යටතේ ආඥාවෙහි සඳහන් ප්‍රාදේශීය ලේකම්ගේ අංකය හික්/ප්‍රාලේ/ඉඅ/4/පොදු 9 යන්න ඉවත්කොට ඒ වෙනුවට කඹු/ඉ2/01/67 වශයෙන්ද, ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියා ප්‍රාදේශීය ලේකම් හික්කඩුව යන්න වෙනුවට ප්‍රාදේශීය ලේකම් කඹුරුපිටිය වශයෙන්ද, ආදේශ විය යුතු බව මෙයින් ප්‍රකාශ කරමි.

ජීවන් කුමාරණතුංග,
ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍ය.

2009 දෙසැම්බර් මස 15 වැනි දින.
ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය,
"ගොවිජන මන්දිරය",
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

01 – 525

# ඉඩම් නිදහස් කිරීම පිළිබඳ දැන්වීම්

## ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

### 39 (1) වැනි වගන්තිය යටතේ පැවරීමේ ආඥාව අවලංගු කිරීම

ඉඩම් අත්කර ගැනීමේ පනතේ 38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ පනවන ලද්දාවූ ද අංක 1510/12 හා 2007.08.14 වැනි දින දරන රජයේ *අති විශේෂ ගැසට්* පත්‍රයේ පල කරන ලද්දා වූද, 2007 අංක 216 හා 2007.08.10 වැනි දින දරන ආඥාවෙන් මෙහි පහත උපලේඛනයේ වඩාත් සවිස්තර ලෙස දක්වා ඇති ඉඩම් කොටස් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය වෙත පැවරී තිබේ.

එනමුත් මේ කියන ලද ඉඩම් කොටස්වල භුක්තිය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය වෙනුවෙන් තවම භාරගෙන නැත. එබැවින් ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍ය ජීවන් කුමාරණතුංග වන මම ඉඩම් අත්කර ගැනීමේ පනතේ 39(1) වැනි වගන්තිය යටතේ මා හට පැවරී ඇති බලතල අනුව 1510/12 හා 2007.08.14 වැනි දින දරන *අති විශේෂ ගැසට්* පත්‍රයේ පළ කරන ලද ඉහත සඳහන් 2007 අංක 216 හා 2007.08.10 වැනි දින දරන ආඥාව මෙයින් ප්‍රත්‍යාදිෂ්ට කරමි.

ජීවන් කුමාරණතුංග,
ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍ය.

මගේ අංකය: එල්ඩී/05/2006/පීජ්/350(1).
ප්‍රා. ලේකම්ගේ අංකය: ලුනු/ඉසං/2/ගුවන් අත්පත් /01.
2009 දෙසැම්බර් මස 19 දින,
ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය,
80/5, රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

### උපලේඛනය

හම්බන්තොට දිස්ත්‍රික්කයේ, ලුණුගම්වෙහෙර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මාගම් පත්තුව සුලු කොට්ඨාසයේ, වීරවිල (අ.ග.පි.) ගමේ පිහිටි හම්බන්තොට දිස්ත්‍රික් මැනුම් අධිකාරි විසින් පිළියෙල කරන ලද අංක එච්/එල්එන්ජී/2007/92 හා 2007 මැයි මස 22 දිනැති ප්‍රගමන අනුරේඛනයේ සඳහන් ප්‍රමාණයෙන් හෙක්. 1.674ක් පමණ වන රඹුක්වැවවල *නොහොත්* වෙලගාවලන්ද නමැති ඉඩම් කොටස්වලට මායිම්:

01. කැබලි අංක 11 – රඹුක්වැවවල *නොහොත්* වෙලගාවලන්ද – ප්‍රමාණය: හෙක්. 0.204
උතුරට: කැබලි අංක 6; නැගෙනහිරට: කැබලි අංක 12; දකුණට: කැබලි අංක 19 සහ 20; බටහිරට: කැබලි අංක 21 සහ 10.

02. කැබලි අංක 12 – රඹුක්වැවවල *නොහොත්* වෙලගාවලන්ද – ප්‍රමාණය: හෙක්. 0.205
උතුරට: කැබලි අංක 6; නැගෙනහිරට: කැබලි අංක 13 සහ 18; දකුණට: කැබලි අංක 19 සහ 20; බටහිරට: කැබලි අංක 11.

03. කැබලි අංක 22 – රඹුක්වැවවල *නොහොත්* වෙලගාවලන්ද – ප්‍රමාණය: හෙක්. 0.205
උතුරට: කැබලි අංක 7, 8; නැගෙනහිරට සහ දකුණට: කැබලි අංක 9; බටහිරට: කැබලි අංක 23.

04. කැබලි අංක 41 – රඹුක්වැවවල *නොහොත්* වෙලගාවලන්ද – ප්‍රමාණය: හෙක්. 0.214
උතුරට: කැබලි අංක 37, 38; නැගෙනහිරට සහ දකුණට: කැබලි අංක 9; බටහිරට: කැබලි අංක 42.

05. කැබලි අංක 43 – රඹුක්වැවවල *නොහොත්* වෙලගාවලන්ද – ප්‍රමාණය: හෙක්. 0.228
උතුරට: කැබලි අංක 35 සහ 36; නැගෙනහිරට: කැබලි අංක 42; දකුණට: කැබලි අංක 9; බටහිරට: කැබලි අංක 44.

06. කැබලි අංක 44 – රඹුක්වැවවල *නොහොත්* වෙලගාවලන්ද – ප්‍රමාණය: හෙක්. 0.194
උතුරට: කැබලි අංක 34 සහ 35; නැගෙනහිරට: කැබලි අංක 43; දකුණට: කැබලි අංක 9; බටහිරට: කැබලි අංක 45.

07. කැබලි අංක 45 – රඹුක්වැවවල *නොහොත්* වෙලගාවලන්ද – ප්‍රමාණය: හෙක්. 0.223
උතුරට: කැබලි අංක 33, 34, 35; නැගෙනහිරට: කැබලි අංක 44; දකුණට: කැබලි අංක 9; බටහිරට: කැබලි අංක 46.

08. කැබලි අංක 51 – රඹුක්වැවවල *නොහොත්* වෙලගාවලන්ද – ප්‍රමාණය: හෙක්. 0.201
උතුරට: කැබලි අංක අ.හු.පි. 3A 1015, 26 සහ 27; නැගෙනහිරට: කැබලි අංක 26, 27 සහ 50; දකුණට: කැබලි අංක අ.හු.පි.A 1015, 53 සහ 52; බටහිරට: කැබලි අංක 53, 52, අ.හු.පි. 3A 1510.

01 – 527

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී